

# වස්ගොමුව ජාතික වනෝද්‍යානය

යූ.ජී.එස්.පතිරණ



**සංවර්ධන ව්‍යාපාරයක් යනු ජනතාවගේ ජීවිත සුඛිත මුදිත කිරීම සඳහා දියත් කෙරෙන ආර්ථික ක්‍රියාවලියක් බව පොදුවේ පිළිගන්නා අතර, එම සංවර්ධනය තුළින් ජනතාවට වඩාත් යහපත් ප්‍රතිලාභ අපේක්ෂා කෙරේ. එහෙත් සෑම සංවර්ධනයක් තුළම පිරිවැයක් ඇති බව මෙනෙහි කරන්නට බොහෝ දෙනා අමතක කරති.**

එබඳු බොහෝ සංවර්ධන ව්‍යාපෘති තුළින් පිරිවැය බවට වැඩි වශයෙන්ම පත්වී ඇත්තේ ස්වාභාවික පරිසරය බව නොරහසකි. කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපාරය ආරම්භවීමත් සමග එහි පිරිවැය බවට ස්වාභාවික වනාන්තර හා එහි විසූ වනසතුන් නිතැතින්ම පත්වූ බව පෙනීයයි. මහවැලි සංවර්ධන ව්‍යාපාරය සඳහා වනාන්තර හෙළිපෙහෙළි වීමෙන් උන්හිටිතැන් අහිමි වූ වන සතුන්ට එක් පිළිසරණයක් බවට නිතැතින්ම පත්වූයේ වස්ගොමුව ජාතික




වනෝද්‍යානය බව සමහර විට ඔබ නොදන්නවා ඇති. මාතලේ හා පොළොන්නරුව යන දිස්ත්‍රික්ක දෙකටම අයත් රමණීය භූමි ප්‍රදේශයක් වසා පැතිරුණු මෙම වනෝද්‍යානය අවතැන්වූ වල් අලීන්ට කදිම "අනාථ කඳවුරක්" සලසාදී තිබේ. වස්ගොමුව දැඩි රක්ෂිතයක් ලෙස 1938 දීත් එම රක්ෂිතයට යාබදව පිහිටි වස්ගොමුව අන්තර් කලාපය දැඩි රක්ෂිතයක් ලෙස 1945 දීත් ප්‍රකාශයට පත්වී ඇති අතර, එම රක්ෂිත භූමි දෙකත් අතිරේක භූමියකුත් ඇතුළත් හෙක්ටයාර් 39322 ක විශාල භූමි ප්‍රමාණයක් එක්කරමින් 1984 දී වස්ගොමුව ජාතික වනෝද්‍යානය ප්‍රකාශයට පත්කර තිබේ.

කොළඹ සිට මහනුවර හරහා වස්ගොමුවට දුර කි.මී. 225 ක් පමණ වන අතර, මහනුවර මහියංගන මාර්ගයේ හසලක මංසන්ධිය වෙත පැමිණ එතැනින් හැරී විල්ගමුව හරහා වස්ගොමුව ජාතික වනෝද්‍යානය වෙත පැමිණිය හැකිය. හසලක සිට වස්ගොමුව වනෝද්‍යානයට දුර ක්‍රි.මී.45 කි. මීට අමතරව මාතලේ සිට පැමිණෙන්නන්හට ලග්ගල වල්ගොමුව හරහා වස්ගොමුවට ළගා විය හැකිය.

පුරාණ කාලයේ ජනාවාසව තිබූ නද අද වනාන්තර ගතව පවතින මෙම පරිසරය ආශ්‍රිතව ඓතිහාසික වැදගත්කමක් ඇති ස්ථාන රැසක් ද හමුවේ. මහපරාක්‍රමබාහු රජ දවස ඉදිතරන ලද කාලිංග යෝධ ඇළද දැනට නෂ්ඨාවශේව පවතින මාගමුව,විලිමිටිය, වස්ගොමුව, දස්තොට වැනි වැව් වලින්ද බුදුරුවයාය බුදුපිළිමය, මාලගමුව ගල්කණු හා නටබුන්ද එහි පැවති ඓතිහාසික ශ්‍රී විභූතිය පෙන්නුම් කරයි. මීට අමතරව දුටුගැමුණු








එළාර යුද්ධය සම්බන්ධයෙන් දක්වෙන තොරතුරු හා විස්තර ආදියේ දී සඳහන් වන කඳවුරු බිමක් වන යුධගනාපිටිය වස්ගොමුව වනෝද්‍යානය තුළ පිහිටා තිබේ. සිත් ඇදන්නා සුළු ස්ථානයක් වන මාලදුවද ඓතිහාසික වැදගත්කමක් උසුලයි.වියළි කලාපීය මිශ්‍ර සදහරිත වනාන්තර ගණයට ඇතුළත් වන මෙම වනෝද්‍යානයට මි.මී.1650 - 2100 අතර සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනයක් ලැබේ. මෙම ප්‍රදේශයේ සාමාන්‍ය උෂ්ණත්වය සෙන්ටිග්‍රේට් අංශක 28 ක් පමණ වේ. වස්ගොමුව ජාතික වනෝද්‍යානය තුළ ප්‍රාථමික වනාන්තර, ද්විතියික වනාන්තර, ගංගාධාර වනාන්තර ලක්ෂණ හා තණ භූමිද හඳුනාගෙන ඇත.


කොත්ඩලයිට්, තිරිවානා සහ කිරිගරුඬ වැනි සම්පත් වලින්ද පොහොසත් මෙම වනෝද්‍යානයේ බොහෝ තැන් රතු, දුඹුරු, පසින් හෝ රෝන්මඩ පිරුණු පසින් යුක්ත වන බවද දැකිය හැකිය. මහවැලි, අඹන් හා කළු යන ගංගා වලින්ද දූනුවිල ඔයෙන්ද වටවූ මෙම වනෝද්‍යානය තුළ පිහිටි සුදු කන්ද ආශ්‍රිතව ගලාබසින දියදහරින් උද්‍යානය තුළ ගංගා ඇලදෙළ පෝෂණය ලබති.

මෙම වනෝද්‍යානය විවිධ වෘක්ෂලතා විශේෂ වලින් සමන්විත වී ඇති අතර, දැනටමත් මෙහි ශාක විශේෂ 150 කට වැඩි ප්‍රමාණයක් හඳුනාගෙන තිබේ. ඉතා ඉහළින් පිහිටි වන ස්ථරය ඉතා සිත්ගන්නා සුළු වන අතර ආර්ථික වටිනාකමෙන් හා දැවමය වටිනාකමෙන් යුතු ශාක රැසක්ද එහි ඇතුළත් වේ. බුරුත, කළුවර, වෙලං, මිල්ල, වීර, පලු, නෙරළු, ගොඩකිරල, හල්මිල්ල, පාතක්ක, ඉහළම වනස්ථරය තුළින් දැකගතහැකි අතර සෙසු ස්ථරයන්හිදි දිවුල්, වා, තෙලූ, දික්වැන්න වැනි ශාක විශේෂ බහුලව දැකිය හැකිය. ආර්ථික වටිනාකමෙන් යුතු බිං, කොහොඹ, උඩයන් වැනි පැලෑටි ද මෙම වනෝද්‍යානය තුළ හමුවේ.

ඉහළ ජෛව විවිධත්වයකින්ද සමන්විතව ඇති මෙම වනෝද්‍යානය තුළ ශ්‍රී ලංකාවේ වෙසෙන ක්ෂීරපායීන් විශේෂ 23 ක් පමණ හමුවන අතර, එයින් ප්‍රධාන තැනක් ගනුයේ වල් අලින්ය. මෙහි වෙසෙන අලි ගහනය දළ වශයෙන් 150 ක් පමණ වේයැයි ගණන් බලා තිබේ. ශ්‍රී ලංකාවට ආවේණික මහවඳුරා හා රිලවා සුදු කන්ද හා ගංගා ආශ්‍රිත ප්‍රදේශයේ සැරිසරන කුළුමීහරකුන්ද, තිත් මුවන්ද පමණක් නොව අහම්බෙන් මෙන් දිවියා හා වලසා ද දැකබලා ගැනීමට හැකිවේ.

දැනට ලංකාවේ වාර්තා වී ඇති පක්ෂි විශේෂ වලින් 143 ක් පමණ මෙම වනෝද්‍යානය තුළදී ද නිරීක්ෂණය කළ හැකි බව වාර්තා වේ. වනරතු මල්කොහා, වලිකුකුළා, බමුරු මාතවා, රත් නළල් කොට්ටෝරුවා, හබන් කුකුළා ද ඇතුළු ශ්‍රී ලංකාවට ආවේණික පක්ෂි විශේෂ 08 ක් ද ඒ අතර වේ. ඉතා විරල ගණයේ පක්ෂියෙකු (Battrachostomus Monilieger)ද මෙහි වාර්තා වී තිබේ.වස්ගොමුව සමනළයන්ගෙන් ද පිරුණු තැනකි. මෙහි සමනළ විශේෂ 50 ක් පමණ හඳුනාගෙන ඇති අතර ඉන් සමනළ විශේෂ 09 ක් පමණ දැකබලාගත හැක්කේ ශ්‍රී ලංකාවේ දී පමණක් බව කියැවේ. ශ්‍රී ලංකාවට ආවේණික ගල්පාටියා හා ගල්කොස්සාද ඇතුළු මත්ස්‍ය විශේෂ 17 ක් පමණ මෙහි ජලාශ හා දිය කඩිති ආශ්‍රිතව හමුවන අතර කබරගොයින් මෙන්ම කිඹුලන්ද ඒවායේ සැරිසරනු දැකගත හැකිය.







එපමණක් නොව උභයජීවීන් විශේෂ 08 කට හා උරග විශේෂ 17 කට ද වස්ගොමුව වනෝද්‍යානය නිවහන් සලසාදී තිබේ. ශ්‍රී ලංකාවට ආවේණික උරග විශේෂයක් වන ලක්හිරළුවා, සර්ප විශේෂයක් වන අතර දණ්ඩාද, කටුසු විශේෂ වන පිණුම් කටුස්සා හා තොලවිසිතුරු කටුස්සා ද ඒ අතරට ඇතුළත් වේ.

සංචාරකයන්ට වස්ගොමුව වනෝද්‍යානය තුළ රැයක් දෙකක් ගත කිරීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා කඳුරුපිටිය, වවුල්එබේ හා මහවැලි ගඟ අසබඩ සංචාරක නිවහන් තුනක්ද පිහිටා තිබේ. මීට අමතරව කඳවුරු බිම් 04 ක් වෙන්කර තිබේ. ගලේ බංගලාව හා අංගමැඩිල්ල සංචාරක නිවාසයද සංචාරකයන් වෙනුවෙන් වනෝද්‍යානයෙන් පිටත පිහිටා තිබේ.

ශ්‍රී ලංකාවේ සුවිශේෂී පරිසර පද්ධතියක් වශයෙන් ද වැදගත් වස්ගොමුව ජාතික වනෝද්‍යානය තුළට ඇතුළුවන සංචාරකයන්ට මගපෙන්වන්නකුගේ සහායද ලබාදේ. කෙසේ වුවද වනෝද්‍යානය තුළ සංචාරකයන් විසින් පිළිපැදිය යුතු නීතිරීති කොතෙක් දක්වා ඇත්ද විශේෂයෙන් සමහර දේශීය සංචාරකයන් නිසා පරිසර පද්ධතියට සිදුවන හානි ගැනද අමතක කළයුතු නොවේ. විශේෂයෙන් වාහනවල ශබ්දය හා මිනිසුන්ගේ කෑකෝ ගැසීම්, පොලිතින්, බිස්කට් ඇසුරුම් ආදී අපද්‍රව්‍ය වනෝද්‍යානය තුළ දමායැම ශාක හා වල්පැලෑටි වලට හානි කිරීම වැනි ද සිදුවීම් වැළැක්වීම සඳහා සංචාරකයන් දැනුවත් වීම හා ස්වයං විනයකට හැඩගැසීම ඉතා අත්‍යවශ්‍යම කරුණක් වී ඇති බව අවසාන වශයෙන් සඳහන් කළ යුතුව ඇත. ❑